සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**13 ශ්‍රේණිය** | **කෘෂි විද්‍යාව** | **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 - (5) | 2 - (5) | 3 - (1) | 4 - (2) | 5 - (3) | 6 - (2) | 7 - (2) | 8 - (2) | 9 - (3) | 10 - (2) |
| 11 - (1) | 12 - (3) | 13 - (3) | 14 - (3) | 15 - (5) | 16 - (3) | 17 - (4) | 18 - (1) | 19 - (2) | 20 - (3) |
| 21 - (2) | 22 - (4) | 23 - (5) | 24 - (5) | 25 - (3) | 26 - (5) | 27 - (2) | 28 - (4) | 29 - (3) | 30 - (4) |
| 31 - (4) | 32 - (2) | 33 - (1) | 34 - (4) | 35 - (3) | 36 - (2) | 37 - (3) | 38 - (4) | 39 - (3) | 40 - (3) |
| 41 - (3) | 42 - (1) | 43 - (1) | 44 - (4) | 45 - (2) | 46 - (4) | 47 - (4) | 48 - (4) | 49 - (3) | 50 - (4) |

## II කොටස

### A කොටස ව්‍යුහගත රචනා

01 (a) (i) ජීව්‍යතාව පරීක්ෂාව සඳහා ටෙට්‍රාසෝලියම් පරීක්ෂාව වේ.

(ii) ජීව්‍යතාවට බලපාන :

- ප්‍රවේනික සාධක
- බාහිර සාධක (පරිසර උෂ්ණත්වය හෝ ආර්ද්‍රතාවය)
- අභ්‍යන්තර සාධක

(iii) සුප්තතා ආකාර :

- පැවැරුණු සුප්තතාව
- රසායනික සුප්තතාව
- සහජ සුප්තතාව
- රූප විද්‍යාත්මක හෝ කායිකා විද්‍යාත්මක සුප්තතාව

(b)

| | කිරි නියැදිය | සාමාන්‍ය මේද ප්‍රතිශතය |
|---|---|---|
| 1. | ප්‍රිෂියන් කිරි | 3.3% 3.7% |
| 2. | මී කිරි | 7% 8% |
| 3. | එළු කිරි | 4% 4.5% |

(c) ආහාර පරිරක්ෂණ ක්‍රම :

| ක්‍රමය | උදාහරණය |
|---|---|
| • වියළීම | දෙල්, කරවල, කරවිල, කොස් ඇට |
| • වැලි යට දැමීම | කොස් ඇට, දෙහි |
| • ලුණු දැමීම | අඹ, බිලිං, දෙහි |

02 (a)

- පට්ටි ගොනුන් පාලනයට වියදම් අවශ්‍ය නොවීම.
- ගැබ් ගැන්වීමේ සඵලතාවය වැඩිය.
- ලිංගික රෝග සම්ප්‍රේෂණය වැළකීම.
- උසස් ආරයන් ඉක්මනින් ප්‍රචලිත වීම.
- අඩු මුදලට උසස් සේවයක් ලැබීම.

(b)

- මුල් කිරි වල අඩංගු ප්‍රතිදේහ නිසා පැටවා තුළ ප්‍රතිශක්තිය ජනිත වේ.
- අධික ලෙස පෝෂ්‍ය පදාර්ථ අඩංගු නිසා පැටවාගේ වර්ධනය ඉක්මන්ය.
- විරේක ගුණ නිසා ජීර්ණ පද්ධතිය පිරිසිදු වීම.

(c) ගව රෝග :

- ක්‍රමවත් ප්‍රතිශක්තිකරණ වැඩ පිළිවෙලක් පට්ටිය තුළ ක්‍රියාත්මක කිරීම.
- ක්‍රමවත් සනීපාරක්ෂක වැඩ පිළිවෙලක් අනුගමනය කිරීම.
- රෝගී සතුන් හඳුනා ගැනීම.
- වෙන් කිරීම හා සුදුසු ප්‍රතිකාර කිරීම.

- වසංගත රෝග වලදී මලකුණු හා ශේෂ පිළිස්සීම.

(d)
- තාප ප්‍රතිකාර පැස්ටරීකරණය, ජීවාණුහරණය
- උකු කිරි
- යෝගට් නිපදවීම
- විසිරි වියලීම කිරි පිටි සෑදීම
- සිසිල් කිරීම
- චීස්, බටර් නිපදවීම

(e)
- එළවළු කල් තබා ගැනීම.
- විජලනයට ලක්කිරීම.
- රසායන ද්‍රව්‍ය යෙදීම. (අච්චාරු)
- ශීතරණ තුළ තැබීම.
- ලුණු දැමීම.
- ටින් කිරීම.

03 (a)
1. වටේට සනකම් ජෛව වැටක් යෙදීම.
2. ඇතුළුවන දොරටුව ඉදිරියේ විෂ බීජ නාශක (Foot bath) එකක් සෑදීම.
3. ඇතුළු වන පුද්ගලයින් සතුන් හා උපකරණ පිළිබඳ විමසිලිමත් වීම.

(b)
- අවශ්‍යතාව සැපයීමට යෙදිය යුතු පොහොර ප්‍රමාණය ඉතා විශාලයි.
- පරිහරණය අපහසුය.
- පළිබෝධ ව්‍යාප්ත වීමට ඇති හැකියාව වැඩිය.
- ජීර්ණ කාලය වැඩිය.
- ඌනතා වලට නුසුදුසුය.
- සැපයෙන පෝෂක ඉතා අඩුය.

(c)
- අන්තර් ගත කර ඇති විවිධ සංඝටක ලැයිස්තුව
- නිෂ්පාදිත දිනය
- නිෂ්පාදකයාගේ නම සහ ලිපිනය
- ආකලන ද්‍රව්‍ය
- කල් ඉකුත්වන දිනය
- ශුද්ධ බර පරිමාව
- කාණ්ඩ අංකය

(d) <u>බාහිර ලක්ෂණ</u> :
- අණ්ඩාකාර හැඩය සහිත වීම.
- පිපිරීම් හෝ අපද්‍රව්‍යවලින් තොර වීම.
- වර්ගයට අනුකූල වර්ණය.
- කටුවේ සනකම ඒකාකාරී වීම.

<u>අභ්‍යන්තර ලක්ෂණ</u> :
- අභ්‍යන්තර රුධිර ලෙස නොතිබීම.
- වාත අවකාශ නියමිත ප්‍රමාණයට තිබීම.
- කහ මද 1 ක් පමණක් තිබීම.
- අඳුරු ලප නොවීම.

04 (a) (i) න්‍යෂ්ටියක් සහිත සෑම ශාක සෛලයකටම අනුනනය මඟින් තමා සම්භවය වූ ශාකය හා සමාන ශාකයක් බිහි කිරීමට ඇති හැකියාව වේ.

(ii) වාසි :
- ඉතා කුඩා කොටසකින්, කුඩා ඉඩක විශාල පැළ සංඛ්‍යාවක් ගත හැක.
- වෙනත් ක්‍රම වලින් වර්ධක ප්‍රචාරණය නොවන ශාක බෝ කිරීම.
- රෝගී ශාකයකින් වුවද වෛරස වලින් තොර ශාක බිහිකිරීම.

(b) <u>නොවීමට හේතු</u> :
- අදාළ ශිල්පීය දැනුම ගොවීන් අතර නොතිබීම.
- අදාළ මෙවලම් ලබා ගැනීමට ප්‍රාග්ධන අවශ්‍යතාව වැඩිවීම.

(c) (i)
- ඛාදනය සිදුවීමෙන් පස ප්‍රමාණාත්මකව අඩුවීම.
- කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය නිසා $P^H$ අගය වෙනස්වීම.
- පෝෂක විෂ වීම.
- අවිධිමත් බෝග වගාව.
- අනවශ්‍ය ලෙස භූමි පරිහරණය
- පස සුසංහනය වීම.
- අක්‍රමවත් ජල කළමනාකරණය.

(d)
- අපරීක්ෂාකාරීව බිම් සැකසීම.
- භූමි භාවිතයේ නොසැලකිලි බව.
- අපරීක්ෂාකාරීව ජල සම්පාදන හා ජල කළමනාකරණය.
- කැලෑ එළි කිරීම.

## <u>B කොටස රචනා</u>

අදාළ පිළිතුරු ඇත්නම් ලකුණු දෙන්න.

The National e-learning Portal for the General Education